




## සිසිර දිසානායක

# "වාග් ගේය කාර්"

'මට තියෙනවා බරපතල චෝදනාවක්. තමුන්ට විරුද්ධව කරන්න. පින්සල නාන කාමරයෙන් එළියට ආවේ සාලුවත් කරේ දමාගෙන.
'නෑ .... හ් '' පන්හිඳගේ ඇහි බැම නළලේ.
''දන්නවාද මොකක්ද කියලා?' පින් කුස්සිය දිහාවට ගියා.

''නෑ?'' පන් ප්‍රශ්ණාර්තයක් අරගෙන පින් පස්සෙන් ගියා.
''ශිරෝමාගේ ඩී.වී.ඩී. එක බැලුවද?
''නෑ ''

ශ්‍රදෑහ්... ශ්‍රදෑහ් නෙවෙයි. ශිරෝමාගේ සී.ඩී. එක ලංකාවෙ එළිදක්වපු වෙලාවෙ ජයලත් මනෝරත්න මහත්තයා කරපු කතාව අහලා බැලුව නං හොඳා '' පින් කීවත් බෙන්චි එක පිටි පස්සෙ තිබුණ බාර් ස්ටූල් එකක වාඩි වුණේ කරේ තිබුණ සාළුව ඔළුවට දා ගන්න ගමන්. හරියට නඩුකාර උන්නාන්සේ කෙනෙකුට ඇඳලා වගෙයි.

'ඇයි මොනවද කියලා තියෙන්නෙ?' පන් බින්දුවටම බැහැලා කිවත් බෙන්චි එක ඉස්සරහා බිම ඉන්ද වුණා ඉබේටම. පන් කොහොමත් අනුන්ගේ අදහස්වලට ගරු කරනවා ඒකයි පින්ගේ චෝදනාවට ඔය හැටි බය වුණේ.

'උසාවිය නිශ්ශබ්ද වෙනු '' පින් ''රසිකාධිකරණයේ කටයුතු ආරම්භ කළේ බෙන්චි එක උඩ තිබුණ බත් හැන්දෙන් බෙන්චි එකට තුන් පාරක් ගහලයි.
''ප්‍රවීණයෙකුගේ අදහස්වලට පටහැනිව අදහස් ඉදිරිපත් කරමින් මෙල්බර්න් ගායිකා ශිරෝමා පුනාන්දුගේ කුසලතාවයන් අධිතක්සේරු කිරීමයි යුෂ්මතාට විරුද්ධව ඇති චෝදනාව.'' කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වීමට යෙදුණු 'නුඹ ළඟ මං'' ගීත එකතුව එළිදැක්වීමේ උත්සවයේදී ජයලත් මනෝරත්න ප්‍රවීණ රංග ශිල්පියාණන් විසින් ඇයගේ ගීත රචනා පිළිබඳව නැවත වරක් සිතා බැලිය යුතු වන්නේ යයි ප්‍රකාශ කර තිබියදී යුෂ්මතා ඇය හට 'වාග් ගේය කාර්'' නම් වූ නාමයක් පවා පටබඳිමින් අගැයීම පිළිබඳව නිදහසට කාරණා තිබේද?'' පින් ළඟ තිබුණ ටැලිෆෝන් ඩිරෙ-ක්ටරිය පෙරළුවා.

''මා ඒ වගක් දැන සිටියේ නැත ස්වාමීනි. මා කළේ මා දන්නා තරමින් කරුණු දැක්වීමක් පමණයි.

''වාග් ගේය කාර්'' යනු ගීත රචනය, තනු නිර්මාණය සහ ගායනය යන කාර්යයන් තුනම කළ හැකි ශිල්පී ශිල්පිනියන් හැඳින්වෙන අන්වර්ථ නාමයක් විනා ගෞරව නාමයක් නොවේ. මනෝරත්නයන්ගේ අදහස අනුව ඇය හට වැඩි දියුණු කර ගැනීමට ඇත්තේ රචනා කලාව පමණයි. එහෙත් එක ගීයක් හෝ හරියාකාරව රචනා කොට ඇත්නම් නිබන්ධකයෙකු ලෙස සැලකිය යුතු වෙනවා. ශිල්පී සුනිල් එදිරිසිංහයන් ගායනා කරන 'සඳකඩ පහණක කැටයම් ඔපලා'' ගීතය පමණක් රචනා කළ වොලී නානායක්කාර රංගන ශිල්පියා ඊට කදිම නිදසුනකි. එලෙසින් බලන කල ශිරෝමා රචනාවන් අතර සරු යැයි සැළකිය හැකි නිර්මාණ කීපයක්ම තිබෙනවා. ඒ අතරින් 'පට සළු වියනට' අංග සම්පූර්ණ ගීයක් ලෙසින් දැක්විය හැකියි. 'මා දං හිඹුටු බෝවිටියා'' ''කෝහේ සිටන් ඔබ'' ගීත බොහෝදුරට ප්‍රශස්ත මට්ටමේ ඇති ගීතයි. ''කොහේ සිටන් ඔබ'' ගියේ ලියැවී ඇති ''මා සවනට එන නුඹේ කෙඳිරිලි හඬ'' යෙදුම ඇය යොදා ගෙන ඇත්තේ නවක රසිකාවියක ලෙස තරමක අවදානමක් ඇතිව බව මම එදා වේදිකාවේදීත් සඳහන් කළ ස්වාමිනී. ප්‍රවීණයින් ඒ ආකාරයේ අදහස් දක්වා ඇති ආකාරයන් දැක්වීමට ''කේ.ඩී.කේ. ධර්ම වර්ධනයන් ලියූ 'කුමරියක පා සලඹ සැළුනා'' ගීතයත්, ''සඟවා ගනු මැන ඔබෙ රුව'' ගීතයත් පූර්වාදර්ශ ලෙසින් ගෙන දැක්වුවා.''

''නුඹ ළඟ මං'', 'මට දෙන්න බැරිද', විඩාබර මුවින්'', වැනි ගීතවල සෘජුවම අදහස් ලියා දැක්වීම ඇතැම් අයගේ වින්දන ශක්තිය අනුව විවාදාත්මක පුවත්, සරළ වින්දනයන් රුචි කරන රසිකයින් සඳහා එවන් ගී කීපයක් නිර්මාණ එකතුවක පෙළ ගැන්වීම මට නම් විශාල වරදක් සේ දකින්නේ නෑ ස්වාමීනි. ප්‍රවීණයින් අතින් ද එවන් පදවැල් ලියවිලා තියෙනවා නොවේද ස්වාමීනි. 'නඟණ්ඩියේ' ගීතය වෙනමම ආරයක ගීතයක් හැටියටයි අපි දකින්නේ. ගැමි පරිසරයෙන්, ගැමියන්ගෙන් උකහා ගත් ප්‍රාදේශීය බස්වහර පමණක් නොව උච්ඡාරණය කරන ආකාරයද රචනාවටත්, තනුවටත් ඒ මගින් ගායනයටත් ඇතුළත් කර ගැනීම නැවුම් නිර්මාණාත්මක කුසලතාවයක් ලෙසින් මා දකිනවා.

ශිරෝමාට මේ දේවල් මීට වඩා හොඳින් කරගෙන යාමට අවශ්‍ය කරන සම්පත් මෙන්ම කුසලතාවයන්ද තිබෙනවා. මේ කුසලතාවයන් තුනම ඇති කාන්තාවක අපගේ සිංහල ගීත වංශයේ හමුවන්නේ පළමු වතාවට යි ස්වාමිනී. මාගේ දැනුමේ හැටියට එය මුසාවක් නොවේ. විශාරද නන්දා මාලනිය අන් රචකයන් අතින් ලියැවුණු පද රචනාවන්ට තනුව යොදාගෙන ගායනා කළා. ඒ බව පමණක් මයි මා නම් දන්-න්. පණ්ඩිත් අමරදේව, සුනිල් ශාන්ත, සිසිර සේනාරත්න, සෝමතිලක ජයමහ, ලයනල් රන්වල, ක්ලැරන්ස් විජේවර්දන, රූකාන්ත ගුණතිලක වැනි 'වාග් ගේය කාර්'' තත්ත්වයේ හුන් ශිල්පීන් ඒ ඒ කාලයේ තමන්ගේ සිතැඟියා-වන්ට අනුව නව නිර්මාණ කළ නිසයි ස්වාමීනි ඔවුන් ඒ ඒ ගී ආරයන්ගේ පුරෝගාමීන් වුයේ. එවන් ප්‍රවීනයින් හා සැසඳීමට නොහැකි වුවද ශිරෝමා හටද ඒ හැකියාවන් යම් තරමක් හෝ ඇති බව මේ ගී නිර්මාණ නවයෙන් පෙනෙනවා. මේ කාර්යයේදී තමන්ගේ නව අදහස් නිදහසේ කිරීමට ඉඩ ලැබෙනවා වගේම අවාසි සහගත තත්ත්වයන්ද තිබෙනවා. වෙනත් නිර්මාණ ශිල්පීන් හා මුහුව කෙරෙන සාමූහික ප්‍රයත්නයකදී වඩාත් ඔපමට්ටම් වුණ අවසන් පලයක් ලැබෙනවා. වාග් ගේය කරුවකුට ඒ අවස්ථාව මඟ හැරෙනවා පමණක් නොවේ. තමන්ගේ දොස් රසිකයින්ට විවෘත වන තෙක්ම පෙනෙන්නට ලැබෙන්නේ නැති වෙනවා. ශිරෝමා යොදාගෙන ඇති ඇතැම් වචන ගී නිබන්ධනයන්ට ආගන්තුකයි.

''මහත්හොරුන්'','සිදාදියේ එච්චන්''වැනි වචන සිය අදහස් සෘජුවම කියා පෑම සඳහා යොදා ගෙන තිබෙනවා. සීමාවන් හඳුනා ගෙන රචනා කරන්නේ නම් ඒවා රසිකයින් අතින් ප්‍රතික්ෂේප නොවනු ඇතැයි අප සිතනවා. පූර්වාදර්ශ ලෙසත් රත්න ශ්‍රී විජේසිංහයන්ගේ යෙදුම් තුනක් වූ 'ට්‍රැක්ටරේ යකඩ ගප්සෙන්'', ''අජානීය ස්කූටර් තුරඟා'', 'සෙලියුලර් කුරුළු රෑන්' යෙදුම් මා හුවා දක්වනවා. ස්වාමීනි.



ශිරෝමාගේ රචනා පමණක් නොව, තනු නිර්මාණත්, ගායනාවනුත් වඩාත් බර වුයේ ගැමි ආරයට. ඉන් මිදුන ගීත කීපයක්ද නොවූවා නොවේ. ඇයගේ ගැමි ආරයට ආශක්තව ඇගයුවා විනා ඇයගේ නිර්මාණ අධිතක්සේරු කලා නොවේ ස්වාමිනි. ඇයගේ මුල්ම නිර්මාණ එකතුවෙන් සුලු කුසලතාවයන් හෝ දුටුවා නම් එය ඉස්මතු කර දැක්වීමත් වාග් ගේය කාරියකගේ නිර්මාණ විඳින්නට ලැබෙන විරල අවස්ථාව පිළිබඳව දැනුවත් කිරීමත් අපගේ යුතුකමක් වන්නේ ඇයගේ ඉදිරි ගමනට එය දිරිදීමක් ලෙසින් අප සිතන නිසයි. ඉදිරියේදී ඇය සිය කුසලතා වඩාත් ඔප් නංවා ගෙන වඩාත් දුර ගමනක් යනවා ඇති. අප හට දැනෙන අඩුපාඩු කීපයක් පිළිබඳව පෞද්ගලිකව දැනුවත් කළේ ඒ දුර ගමන යනවා දකින්නට ඇති අවංක ප්‍රාර්ථනයෙන්. ඉතින් මා කළ කී දේ පිළිගැනීම හෝ ප්‍රතික්ෂ්ප කිරීම ''රසිකාධිකරණයටම'' භාරයි ස්වාමීනී.
පින් ඩිරෙක්ටරිය වහලා සාළුව අතට ගත්තා.





ARE YOU LOOKING FOR A RELIABLE & AFFORDABLE WEB HOSTING SERVICE..?
ඔබ සොයන්නේ විශ්වාසදායී හා මිල පහසු වෙබ් හොස්ටිං සේවාවක් නම්
DIGIFAST HOSTING AUSTRALIA
Web Hosting From $36/Year
Domain Names From $11.95/year
ඔබේ වෙබ් අඩවිය සුරැකිව අන්තර්ජාලයට එක්කරන්නට අපට බාරදෙන්න
අවුරුද්දකටම ඩොලර් 36 යි
Visit www.digifast.com.au
for more information

ඔබේ මුදල් ශ්‍රී ලංකාවට පහසුවටත් ඉක්මනටත් යවන්න
සූරිය SOORIYA
සූරිය මාකටින් සර්විසස්
AFS CASH 2 HAND සමගින්
22 Lorne Street Lalor Vic 3075 Tel : 9402 5380 Melway 9B6

ඔබ කනස්සල්ලෙන් ද..? පසුතැවිල්ලෙන් ද..?
ඔබට විශ්වාසදායක උපදේශක සේවාවක් අවශ්‍යයි ද?
එසේ නම්
ඔස්ට්‍රේලියානු උපදේශක සංගමයේ ලියාපදිංචි සාමාජිකාවකගෙන් එම උපදේශක සේවය ලබාගැනීමට දැන්අවස්ථාව ඇත
- සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම සේවය
- පහසු අයකිරීම්

ශ්‍රී ලාංකික ඔබ සඳහා විශේෂයි
MPS Counselling Service
Shiromi Perera (MACA)
Mast. Couns, Grad Dip Couns, BSc
CLINIC
20/215 Betula Ave
Mill Park VIC 3082
Tel: (03) 9436 6965
Mob: 0448 829 905
Email : shiromi.p@optusnet.com.au
ACA AUSTRALIAN COUNSELLING ASSOCIATION
REGISTERED MEMBER OF THE AUSTRALIAN COUNSELLING ASSOCIATION

VCE
Chemistry, Biology & Maths
Tuition
Offered by an
Australian Qualified & Experienced Teacher
Sandya De Silva
(B. Sc., M.Sc. Dip.Ed.)
Tel: 9437 7801
Mobile: 0402 503 398
REGISTERED TEACHER OF
THE VICTORIAN INSTITUTE OF TEACHING